# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1949/39 - 2016 ජනවාරි මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2016.01.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික) විධිවිධාන පනතේ 2 වන වගන්තිය අනුව කියවිය යුතු නගර සභා ආඥාපනතේ 247 වන වගන්තිය යටතේ වූ නියමය

වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍ය හා වයඹ පළාත් මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය ධර්මසිරි දසනායක වන මා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික) විධිවිධාන පනතේ 2 වන වගන්තිය සමග කියවියයුතු 255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 247 වගන්තියේ සඳහන් විධිවිධාන අනුව පහත සඳහන් නියමය මෙයින් නිවේදනය කරමි.

ධර්මසිරි දසනායක,<br>
වයඹ පළාත්, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය,<br>
පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා<br>
බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ<br>
සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2016 ජනවාරි මස 12 වැනි දින,<br>
කුරුණෑගල දී ය.

**නියමය**

1. මෙම නියමය වයඹ පළාතේ හලාවත නගර සභාවේ හී 2016 වර්ෂය සඳහා වූ අයවැය ලේඛන බලාත්මක කිරීම සම්බන්ධයෙන් වූ නියමය වශයෙන් හැඳින්වේ.
2. වයඹ පළාතේ හලාවත නගර සභාව සඳහා 2016 වර්ෂයට අදාළ අයවැය ලේඛනයක් 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 178 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව සම්මත නොවුන කල්හි අදාළ නගර සභාව විසින් 2016 වර්ෂය සඳහා සකස් කරන ලද කෙටුම්පත් අයවැය ලේඛනය අදාළ නගර සභාව පිහිටි වයඹ පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය යටතේ එකී නගර සභාව විසින් 2016 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීම නිත්‍යානුකූල වන්නේ ය.
3. මෙම නියෝගය 2016.01.01 දින සිට බල පැවැත්විය යුතුවේ.

01- 1067


1A - PG 2788 — 08 (2016/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*